| බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව | | | |
|---|---|---|---|
| අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය - 2020<br>උපකාරක ප්‍රශ්න පත්‍රය | | | |
| ශ්‍රේණිය 11 | විෂය : සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය | පත්‍රය: I | කාලය: පැය 01 යි |

## I පත්‍රය

සැලකිය යුතුයි.

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1) (2) (3) (4) යන වරණ වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරා ගන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.
- එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා ඒවා ද පිළිපදින්න.

---

(01) සන්නිවේදකයා අපේක්ෂා කරන වෙනසම ග්‍රාහකයා තුළ ඒ ආකාරයෙන් ම සිදුවීම හෝ සිදු නොවීමට ඉවහල් වන මූලිකාංගය වන්නේ,
(1) සංඥා (2) බාධක (3) බලපෑම (4) සංදේශය

(02) ද්වි මාර්ගික සන්නිවේදන සූත්‍රයේදී සන්නිවේදන ක්‍රියාවලිය අංග සම්පූර්ණ වන්නේ ග්‍රාහකයාගේ,
(1) ප්‍රතිචාරයෙනි. (2) ප්‍රතිපෝෂණයෙනි. (3) සංදේශයෙනි. (4) බලපෑමෙනි.

(03) තමන්ගේ සංදේශය නිසි ලෙස ග්‍රාහකයාට ග්‍රහණය කර ගන්නට සැලැස්වීම සන්නිවේදකයාගේ අරමුණයි. එම අරමුණ ඉටු කර ගැනීමේ දී ඇති වන ගැටලු හඳුන්වන්නේ,
(1) අර්ථ බාධක (2) පාරිසරික බාධක
(3) මාධ්‍ය බාධක (4) සන්නිවේදන බාධක


(04) පුවත්පත, ගුවන් විදුලිය හා රූපවාහිනිය අදාළ ග්‍රාහකයන් වන්නේ,
(1) ප්‍රේක්ෂකයා, අසන්නා, ප්‍රතිග්‍රාහකයා (2) පාඨකයා, ශ්‍රාවකයා, ප්‍රේක්ෂකයා
(3) ප්‍රතිග්‍රාහකයා, අසන්නා, පාඨකයා (4) පාඨකයා, ප්‍රේක්ෂකයා, ශ්‍රාවකයා

(05) මාධ්‍ය විචාරයේ දී මූලික වශයෙන් අවධානය යොමු වන්නේ,
(1) මාධ්‍ය සංදේශයට (2) අදාළ ග්‍රාහක කණ්ඩායමට
(3) සංදේශය නිර්මාතෘට (4) ඉදිරිපත් කරන ක්‍රමවේදයට

(06) ඕනෑම සන්නිවේදන අවස්ථාවක දැකිය හැකි පොදු ස්වභාවයක් වන්නේ,
(1) නිශ්චිත සන්නිවේදකයෙකු හා ග්‍රාහකයකු සිටීම.
(2) විධිමත් මූලාශ්‍රයක් පාදක කර ගැනීම.
(3) මනෝ මූලික සිද්ධාන්තයක් වීම.
(4) සත්‍ය සංදේශයක් ම ග්‍රාහකගත කිරීම.

(07) පසුගිය දිනවල පැතිරී ගිය කොවිඩ් - 19 පිළිබඳ විවිධ තොරතුරු ජනමාධ්‍ය හරහා ඉදිරිපත් කිරීමට වැඩි අවකාශයක් වෙන්විය. ඒවා අයත් වන්නේ,
(1) දෘඪ පුවත්වලට ය. (2) විදෙස් පුවත්වලට ය.
(3) මෘදු පුවත්වලට ය. (4) ගවේෂණාත්මක පුවත්වලට ය.

(08) එක් අයෙකු කේන්ද්‍ර කරගෙන බොහෝ දෙනාට සංදේශය පැතිරී යන මෙම ක්‍රමය හැඳින්වෙන්නේ,




(1) චක්‍රීය ආකෘතිය
(2) දාම ආකෘතිය
(3) වයි ආකෘතිය
(4) රෝද ආකෘතිය

(09) මාධ්‍ය ආයතනයකට ළමා ප්‍රවෘත්ති වාර්තාකරුවෙකු ලෙස තෝරා ගැනීමේ සම්මුඛ පරීක්ෂණයක් සඳහා ඔබ ඉල්ලුම් කළ යුතු සුදුසුම ක්‍රමවේදය,

(1) ලිපියක් ලිවීමෙනි. (2) ජීව දත්ත පත්‍රිකාවකිනි.
(3) දුරකථන ඇමතුමක් දීමෙනි. (4) මාධ්‍ය ආයතනයට ගොස් විමසීමෙනි.

(10) ඩිජිටල් කැමරාවක ඡායාරූප සටහන් වන්නේ,

(1) ධන එලකයක් ලෙස ය. (2) ඍණ එලකයක් ලෙස ය.
(3) රසායනික ප්‍රතික්‍රියාවක් ලෙස ය. (4) විනිවිදක පත්‍රයක් ලෙස ය.

(11) මාධ්‍ය වෙත ලැබුණු තොරතුරු ග්‍රාහකගත කිරීමේදී සංස්කරණය කරයි. ප්‍රවෘත්ති සංස්කරණයේදී සිදුවීමට අවම ඉඩක් ඇත්තේ,

(1) වාර්තාවේ භාෂාමය ස්වරූපය වෙනස් කිරීමයි.
(2) ප්‍රවෘත්තිය හා සම්බන්ධ විවිධ පාර්ශවයන්ගේ අදහස් ගොනු කිරීම.
(3) වාර්තා වූ තොරතුරු සංස්කාරකගේ අභිමතය පරිදි සැකසීම.
(4) තොරතුරු තීව්‍ර කිරීමට ඡායාරූපයක් යෙදීම.

(12) හදිසි අවශ්‍යතාවක් වෙනුවෙන් දෙමාපියන් කැඳවීමට විදුහල්පතිතුමන්ට අවශ්‍යව තිබේ. ඒ සඳහා කෙටිම කාලයකින් අඩුම වියදමකින් දන්විය හැකි මුද්‍රණ ක්‍රමවේදය,

(1) සමතල මුද්‍රණය (2) අංකිත මුද්‍රණය (3) තිර මුද්‍රණය (4) උත්තල මුද්‍රණය

(13) අණබෙර, තොවිල්, පූජා කර්ම, ආදිය අද ද සන්නිවේදන කාර්යය සඳහා භාවිත වේ. මේවා අයත් වන්නේ,

(1) අවාචික සන්නිවේදනයට (2) සාම්ප්‍රදායික සන්නිවේදනයට
(3) නිර්මාණාත්මක සන්නිවේදනයට (4) ජන සන්නිවේදනයට

(14) තම ගැටලු නිරාකරණයට අවශ්‍ය විශ්ලේෂණය නව අදහස් උත්පාදනය ආදියට ඉවහල් වන සන්නිවේදන වර්ගය වන්නේ,

(1) අන්තර්වර්තී පුද්ගල සන්නිවේදනය (2) අන්තර් පුද්ගල සන්නිවේදනය
(3) සමූහ සන්නිවේදනය (4) ජන සන්නිවේදනය

(15) ජන මාධ්‍ය හිමිකාරීත්වය සම්බන්ධයෙන් පවතින ප්‍රභේද දෙක වන්නේ,

(1) සමාගම් හා තනි පුද්ගල (2) පවුල් හා රාජ්‍ය
(3) රාජ්‍ය හා පෞද්ගලික (4) රාජ්‍ය හා අර්ධ රාජ්‍ය

(16) විදේශීය ටෙලි නාට්‍ය හඬ කවා විකාශනය කිරීම සම්බන්ධයෙන් රජය විසින් බදු පැනවීමෙන් පැහැදිලි වන්නේ,

(1) රජයේ ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීමයි.
(2) මාධ්‍යයන්හි ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් රජයේ ඍජු මැදිහත් වීමයි.
(3) මාධ්‍යයන්හි ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් රජයේ වක්‍ර මැදිහත් වීමයි.
(4) එවැනි හඬකැවීම් විකාශය කරන ආයතන පාලනය කිරීමයි.

(17) දේශනයකදී ක්ෂණික ප්‍රක්ෂේපණ යන්ත්‍රය භාවිතයට ගත හැක්කේ,
(1) අවශ්‍ය යමක් ඒ මොහොතේ ලියා පෙන්වීමට ය.
(2) කලින් සකස් කරගත් වගු, චාට් ආදිය පෙන්වීමට ය.
(3) වර්ණ විනිවිදක පත් පෙන්වීමට ය.
(4) විවිධ වර්ණ ඡායාරූප පෙන්වීමට ය.

(18) "yahoo" ,"Google" ආදිය දෛනික කටයුතුවලදී භාවිත,
(1) මුද්‍රණ යන්ත්‍රයකි. (2) අන්තර්ජාල වීධි ක්‍රමයකි.
(3) විද්‍යුත් තැපැල් ලිපිනයකි. (4) අන්තර්ජාල සෙවුම් යන්ත්‍රයකි.

(19) අධ්‍යතන ගුවන්විදුලි නාලිකා බොහොමයක් සිය විකාශන කටයුතු සිදු කරන්නේ සංඛ්‍යාත මූර්ජන තරංග ඔස්සේ ය. ඒවා හැඳින්වෙන්නේ,
(1) UHF ලෙසයි. (2) VHF ලෙසයි. (3) FM ලෙසයි. (4) SW ලෙසයි.

(20) එදිනෙදා සන්නිවේදන කටයුතු සඳහා අප බහුලවම භාවිත කළ යුත්තේ,
(1) සරල භාෂාව සහ ප්‍රදීපාගාර උපක්‍රමය වේ.
(2) තාක්ෂණික උපකරණ හා සරල භාෂාවකි.
(3) පංච ඉන්ද්‍රියන් සහ මිශ්‍ර භාෂාවයි.
(4) සරල පැහැදිලි භාෂාව සහ අර්ථවත් අංග චලනයයි.

(21) සන්නිවේදනයේ ගමන් මග සරල ලෙස රූපකාරව දක්වන්නේ,
(1) ෂැනොන් වීවර් ආකෘතියෙනි. (2) ලැස්වෙල්ගේ නිර්වචනයෙනි.
(3) උඩුකුරු පිරමීඩ න්‍යායෙනි. (4) යටිකුරු පිරමීඩ න්‍යායෙනි.

(22) පහත ප්‍රකාශ අතුරින් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) පුවත්පතක මුල් පිටුවේ ඡායාරූපයක් පළ කිරීම අනිවාර්ය වේ.
(2) ඇතැම් කාලවලදී පුවත්පත් සඳහා තහංචි පැනවීමට ඉඩ තිබේ.
(3) සිනමා මාධ්‍යයට ඡායාරූප අනවශ්‍ය වේ.
(4) ජන සන්නිවේදනය ක්ෂණික හා අඛණ්ඩ සජීවී ක්‍රියාවලියකි.

(23) ජන මාධ්‍ය ආයතනයන්හි ප්‍රතිපත්ති සකස් කරන්නේ,
(1) ග්‍රාහකයන් (2) හිමිකරුවන් (3) මාධ්‍යවේදීන් (4) දැන්වීම්කරුවන්

(24) ගුවන්විදුලියට සවන් දීමේදී බොහෝ රූප අප සිතින් මවා ගනියි. එය,
(1) පරිකල්පනය යි. (2) සංජානනය යි.
(3) ද්විරූපතාව යි (4) දෘෂ්ටියේ අඛණ්ඩතාව යි.

(25) පහත සඳහන් ප්‍රකාශ අතුරින් පුද්ගලාන්තර සන්නිවේදන අවස්ථාවක් **නොවන්නේ,**
(1) අතට අත දීම. (2) කෙටි පණිවිඩ යැවීම.
(3) විද්‍යුත් තැපැල් ගිණුමක් ඇරඹීම. (4) ලිපියක් යැවීම.

(26) පුවත්පත් ආයතනයක භාෂා සංස්කාරකගේ ප්‍රධාන කාර්යය වන්නේ,
(1) සංස්කාරක වැකිය සැකසීමයි. (2) භාෂා දෝෂ නිවැරදි කිරීමයි.
(3) මුල් පිටුව සැලසුම් කිරීමයි. (4) රූප එකිනෙක ඇමිණීමයි.

(27) ප්‍රාදේශීය වාර්තාකරුවෙකු වූ නිමල් තම කණ වැටුණ හෝඩුවාවක් ඔස්සේ විවිධ ලිපි ලේඛන හා පුද්ගලයන්ගෙන් තොරතුරු ලබාගෙන යටපත්ව තිබූ තොරතුරක් නැවත මාධ්‍ය හරහා වාර්තා කිරීමට සමත් විය. මෙය,

(1) ප්‍රවෘත්ති දඩයමකි. (2) ප්‍රවෘත්ති විශ්ලේෂාංගයකි.
(3) ප්‍රවෘත්ති ගවේෂණයකි. (4) දෘඪ හෝ මෘදු පුවත් වාර්තාකරණයකි.

(28) පරිගණක ආශ්‍රිත ක්‍රියාවලියේ පියවර පහත දක්වේ.

A) මුද්‍රණය හා පිටපත්කරණය
B) අත්පිටපත් සැකසීම.
C) අකුරු යෝජනය හා පිටු සැලසුම් කිරීම.
D) නිමි කටයුතු

ඉහත පියවර නිවැරදිව දක්වෙන්නේ,

(1) A, B, C, D මගිනි. (2) C, B, A, D මගිනි.
(3) B, C, D, A මගිනි. (4) B, C, A, D මගිනි.

(29) සමාජ ප්‍රතිරූප සම්බන්ධයෙන් ප්‍රකාශ කිහිපයක් පහත දක්වේ.

A) පුද්ගලයෙකු විසින් කළ කාර්යයන් හේතු වේ.
B) සමාජ සත්කාර කාර්යයන් මෙන්ම අපචාර කාර්යයන් ද ප්‍රතිරූප ගොඩ නැගීමට හේතු වේ.
C) ප්‍රතිරූප ගොඩනගා ගැනීමට හැකි වන්නේ ජනප්‍රිය පුද්ගලයන්ට පමණි.
D) භාණ්ඩ හා සේවා අලෙවියට ජනප්‍රිය ප්‍රතිරූප යොදා ගැනීම ඵලදායී වේ.

ඉහත ප්‍රකාශ අතුරින්,

(1) A, B, C, D සියල්ල සත්‍ය වේ. (2) A, B සත්‍ය වේ. C, D අසත්‍ය වේ.
(3) A, B, C සත්‍ය වේ. D අසත්‍ය වේ. (4) A, B, D සත්‍ය වේ. C අසත්‍ය වේ.

(30) සාර්ථක සන්නිවේදකයෙකුට ප්‍රතිපෝෂණ කාර්යය ද වඩා වැදගත් ය. එහිදී වාචික මෙන්ම අවාචික විධික්‍රම ඵලදායීව භාවිතයට ගත හැක්කේ,

(1) ජන සන්නිවේදනයේදී (2) සමූහ සන්නිවේදනයේදී
(3) අන්තර් පුද්ගල සන්නිවේදනයේදී (4) අන්තර්වර්තී පුද්ගල සන්නිවේදනයේදී

(31) සෙවනැලි රූප නැරඹීමට මැජික් ලන්තෑරුම නිර්මාණය කිරීම දෘශ්‍ය මාධ්‍යයේ වැදගත් සන්ධිස්ථානයක් විය. එය සිදු කරන ලද්දේ,

(1) ඇතනේසියස් ක්ලෙචර් (2) මාටින් කූපර්
(3) ජෝර්ජ් ඊස්ට්මන් (4) ඩැගියුරේ

(32) ප්‍රවෘත්තියක අවසාන ඵලය පිළිබඳ යුනෙස්කෝ සංවිධානය පහත සූත්‍රය ඉදිරිපත් කොට ඇත.

| A | + | B | + | C | = | C |

එහිදී C අකුරු දෙකින් දෙවන C අකුරින් පිළිබිඹු වන්නේ,

(1) නිවැරදි බව (2) පැහැදිලි බව
(3) විශ්වාසනීයත්වය (4) සමතුලිත බව

(33) ඉහත සූත්‍රය ඉදිරිපත් කළේ,
(1) හැරල්ඩ් ඩී.ලැස්වේල් (2) පෝල් ඩී.මැසනියර්
(3) චාර්ල්ස් ඇන්ඩර්සන් ඩනා (4) ෂැනොන් වීවර්

(34) ආයතනයක සිය සේවා කටයුතුවලදී අනන්‍යතාව තහවුරු කර ගැනීමට යොදා ගත හැකි ක්‍රමවේදයක් වන්නේ,
(1) දින මුද්‍රාව යෙදීම.
(2) නිල මුද්‍රාව යෙදීම.
(3) ආයතනයේ ලියාපදිංචි අංකය යෙදීම.
(4) නිල මුද්‍රාව සමඟ බලධාරියෙකු අත්සන් යෙදීම.

(35) නිහඬ සිනමාව තම හැකියාව ප්‍රදර්ශනයට ආශිර්වාදයක් කරගත් නිර්මාණ ශිල්පියෙකු වූ නාට්‍යකරුවා වන්නේ,
(1) එඩ්වඩ් හාපර් (2) සුගතපාල ද සිල්වා
(3) චාලි චැප්ලින් (4) එදිරිවීර සරච්චන්ද්‍ර

(36) ජපන් රජයේ පරිත්‍යාගයක් ලෙස 1982 දී මෙරටට ලැබුණු ජනමාධ්‍ය ආයතනය වන්නේ,
(1) ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවයි. (2) ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවයි.
(3) රාජ්‍ය චිත්‍රපට සංස්ථාවයි. (4) ස්වාධීන රූපවාහිනී සේවයයි.

(37) සම්මත රූප රාමු, සම්මත නිෂ්පාදන ක්‍රම වෙනුවට වඩාත් වෙනස් ආකාරයක වැඩසටහන් දක්නට ලැබෙන්නේ,
(1) වාර්තා වැඩසටහන් වලය. (2) සංගීත වැඩසටහන් වල ය.
(3) සඟරාමය වැඩසටහන් වලය. (4) යථාකාරී රූපවාහිනී වැඩසටහන් වලය.

(38) මාධ්‍ය වැඩමුළු දේශනයකදී ප්‍රවෘත්ති වාර්තාකරණය පිළිබඳ ව දැනුම්වත් කිරීමක දී ඔබට අසන්නට ලැබුණු වඩාත් නිවැරදි ප්‍රකාශය කුමක් ද?
(1) උඩුකුරු පිරමීඩ ආකෘතිය යොදා ගැනීම වැදගත් වේ.
(2) පුරවැසි මාධ්‍යකරුවන් වාර්තාකරණය සිදු කරයි.
(3) යටිකුරු පිරමීඩ ආකෘතිය යොදා ගැනීම වැදගත් වේ.
(4) ප්‍රවෘත්තියක වඩාත්ම වැදගත් කරුණු පමණක් සුදුසු වේ.

(39) ශ්‍රී ලංකාවේ ප්‍රථම සිංහල පුවත්පත සහ ලියාපදිංචි ප්‍රථම සිංහල පුවත්පත පිළිවෙළින්,
(1) ලංකාලෝකය හා ලංකෝපකාරය (2) ලංකාලෝකය හා ලක්මිණි පහන
(3) කලම්බු ජර්නල් හා ලක්මිණි පහන (4) ලක්මිණි පහන හා ලංකාලෝකය

(40) ආයතනකට සම්බන්ධ මාධ්‍ය ශ්‍රමිකයින් කොටස් දෙකකි. ඉන් ස්ථිර තනතුරු දරණ මාධ්‍යවේදීන් වන්නේ,
(1) නිදහස් මාධ්‍යවේදීන් (2) මාණ්ඩලික මාධ්‍යවේදීන්
(3) ප්‍රාදේශීය මාධ්‍යවේදීන් (4) විශේෂාංග මාධ්‍යවේදීන්

| බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව | | | |
|---|---|---|---|
| අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය - 2020<br>උපකාරක ප්‍රශ්න පත්‍රය | | | |
| ශ්‍රේණිය 11 | විෂය : සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය | පත්‍රය: II | කාලය: පැය 02 යි |

## II පත්‍රය

සැලකිය යුතුය.

- පළමුවැනි ප්‍රශ්නය හා තෝරාගත් තවත් ප්‍රශ්න 04 ක් ද ඇතුළුව ප්‍රශ්න 05 කට පමණක් පිළිතුරු සපයන්න.
- පළමුවැනි ප්‍රශ්නයට ලකුණු 20 ක් ද, තෝරා ගන්නා අනෙක් සෑම ප්‍රශ්නයකට ම ලකුණු 10 බැගින් ද හිමි වේ.

---

(01) පැතිරී ගිය කොවිඩ් - 19 වසංගත තත්ත්වය හමුවේ මානවයාගේ දෛනික බොහෝ කටයුතු අඩාල වුවත්, අන් කවරදාටත් වඩා තොරතුරු දැන ගැනීමේ උනන්දුව තීව්‍ර විය.

i. තොරතුරක් යනු කුමක් ද?

ii. ජාතික මෙන්ම ජාත්‍යන්තර මට්ටමේ තොරතුරු බෙදා හැරීමට මුල් වූයේ ජනමාධ්‍යයයි. ජනමාධ්‍ය යනු කුමක් ද?

iii. ජනමාධ්‍යයන්ට අමතරව ඔබට තොරතුරු ලබා ගැනීමට ඉවහල් වූ නව මාධ්‍ය විධික්‍රම **දෙකක්** ලියන්න.

iv. දිනපතා පුවත්පත කියවීමට හුරුව සිටි ඔබ පියාට එය නොලැබීම නිසා කියවිය හැකි විකල්ප මාර්ගය කුමක් ද?

v. නව තොරතුරු වාර්තා කිරීමට මාධ්‍යවේදීන්ට ඉවහල් වූ මූලාශ්‍ර **දෙකක්** සඳහන් කරන්න.

vi. තොරතුරු රැස් කිරීමේ දී මාධ්‍යවේදීන් සතුව පැවතිය යුතු ගුණාංග **දෙකක්** ලියන්න.

vii. ජන මාධ්‍යයන් විවිධ නිර්මාණාත්මක ආකෘතීන් යටතේ තොරතුරු ඉදිරිපත් කරන්නට විය. නිර්මාණයක පැවතිය යුතු ගුණාංග **දෙකක්** දක්වන්න.

viii. අවට සමාජයේ තොරතුරු පැතිරී ගිය අවිධිමත් සන්නිවේදන ක්‍රම **දෙකක්** ලියන්න.

ix. මාධ්‍ය ආයතනයන්ට නිල තොරතුරු ලබා ගත හැකි වූ ප්‍රධාන ක්‍රම **දෙකක්** දක්වන්න.

x. කුමන ක්‍රමවේදයකින් තොරතුරු ඔබ වෙත ලැබුණත් විචාරශීලීව ඒවා ග්‍රහණය කර ගැනීමට ඔබ සතුව තිබිය යුතු නිපුණතා **දෙකක්** දක්වන්න. (ලකුණු 2 X 10= 20)

(02) අවිධිමත් ලෙස මාර්ගයේ වාහන හැසිරවීම පිළිබඳව තොරතුරු දැක්වෙන ඡායාරූපයක්, පත්තර විස්තර නම් විශේෂාංගය යටතේ රූපවාහිනී නිවේදකයා සජීවීව ඉදිරිපත් කරන ලදී.

i. මාධ්‍යයන් රැසක් මෙලෙස එකට හමුවීම කුමන නමින් හැඳින්වේ ද?

ii. පුවත්පතක ඡායාරූප භාවිතයෙන් ලැබෙන ප්‍රයෝජන **හතරක්** දක්වන්න.

iii. සන්නිවේදන ස්වරූපයක් වන විධිමත් සන්නිවේදනය සිදුවන අයුරු දළ සටහනකින් දක්වා පැහැදිලි කරන්න.

iv. ජනතාව වෙත තොරතුරු ඉදිරිපත් කිරීමට විද්‍යුත් මාධ්‍ය භාවිත කරන වැඩසටහන් ආකෘතීන් **හතරක්** පැහැදිලි කරන්න. (ලකුණු 10)



බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

(03) 'කොළඹ සිට කථා කරමි. මේ කොළඹ ගුවන් විදුලි සේවයයි.' යන්න එදා ගුවන්විදුලියේ භාවිත වූ අනන්‍යතා ප්‍රකාශනය යි.

i. ගුවන් විදුලියේ ප්‍රථම සිංහල නිවේදකයා කවුරුන් ද?

ii. මුද්‍රිත මාධ්‍යයට නොමැති ගුවන් විදුලියට ආවේණික ප්‍රබලතා **දෙකක්** දක්වන්න.

iii. පවතින තරඟකාරීත්වය හමුවේ ගුවන් විදුලි නාලිකා සිය ග්‍රාහකයන් පොළඹවා ගැනීමට යොදන උපක්‍රම **දෙකක්** පැහැදිලි කරන්න.

iv. ඕනෑම මාධ්‍ය ආයතනයක් විධිමත් සංවිධාන ව්‍යූහයකින් යුක්ත ය. ජන සන්නිවේදනයට අදාළ විශේෂ ලක්ෂණ **හතරක්** ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 10)

(04) පවනි සහ සවනී ලබාදී තිබූ පැවරුමට අදාළ පොතෙහි නිර්මාණ කටයුතු අවසන් කර තිබුණි.

i. පොතෙහි අකුරු යෝජනය හා පිටු සැලසුම් කිරීමට භාවිත කරන මෘදුකාංගයක් ලියන්න.

ii. පරිගණකය මගින් සැලසුම් කළ පිටුවල මුද්‍රණ පිටපත් ලබා ගැනීමට භාවිත කරන මුද්‍රණ යන්ත්‍ර **දෙකක්** ලියන්න.

iii. පවනී හා සවනී සැකසූ පොතෙහි නිමි කටයුතු සඳහා යොදාගත් උපකරණ **තුනක්** නම් කර එහි කාර්යයන් කෙටියෙන් පැහැදිලි කරන්න.

iv. කොවිඩ් - 19 හෙවත් කොරෝනා පාලනය කිරීම සඳහා හඳුන්වා දුන් දෘශ්‍ය ප්‍රකාශන විධි **හතරක්** විස්තර කරන්න. (ලකුණු 10)

(05) දුරකථනය භාවිත කරමින් ගීතයක් රසවිඳිමින් සිටි මිහිරංග රූපවාහිනියේ ප්‍රචාරය වූ ප්‍රවෘත්ති විකාශය සඳහා යොමු වුයේ රටේ නවතම තොරතුරු දැනගැනීම උදෙසා ය.

i. ප්‍රවෘත්ති ප්‍රකාශනයක දක්නට ලැබෙන්නේ කුමන වාර්තාකරණය ද?

ii. ප්‍රවෘත්තියක වටිනාකම කෙරෙහි බලපාන සාධක **දෙකක්** ලියන්න.

iii. ප්‍රවෘත්තියක් මනා පිළිගැනීමකින් යුක්ත වීමට නම් එම තොරතුරුවල පවත්නා ගුණාංග **තුනක්** නම් කර පැහැදිලි කරන්න.

iv. මෙහි සඳහන් වන ප්‍රවෘත්තිය ඇතුළත් සන්නිවේදන වර්ගය මගින් සමාජයට ඇති කරන බලපෑම කරුණු **හතරක්** ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 10)

(06) සන්නිවේදන ක්‍රියාවලියක් සාර්ථක වන්නේ සන්නිවේදකයා හා ග්‍රාහකයාගේ දායකත්වය මත ය.

i. ග්‍රාහකයින් මාධ්‍ය සංදේශ සම්බන්ධයෙන් කටයුතු කරන ආකාරය අනුව කාණ්ඩ දෙකකට බෙදා දැක්විය හැකිය. ඉන් **එකක්** නම් කරන්න.

ii. මාධ්‍ය වෙත ප්‍රතිචාර ඉදිරිපත් කළ හැකි ක්‍රම **හතරක්** නම් කරන්න.

iii. වර්තමාන ළමයාගේ සමාජ දිවිය බොහෝ විට හැඩගස්වනු ලබන්නේ ජනමාධ්‍යයයි. මාධ්‍ය මගින් ළමයාට එල්ල කරන අයහපත් බලපෑම් **තුනක්** පැහැදිලි කරන්න.

iv. 'ප්‍රක්ෂේපණීය නොවන මාධ්‍ය උපකරණ වලට වඩා ප්‍රක්ෂේපණීය උපකරණ ප්‍රබලතාවක් ඉස්මතු කරයි.' කරුණු **හතරක්** ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 10)

(07) i. වාචික භාෂාවට වඩා වෙනස් ලෙස ලිඛිත භාෂාව ගොඩනැගී රූප **දෙකක්** ලෙස පෙන්නුම් කිරීම හඳුන්වන නම කුමක් ද?

ii. භාෂාව යොදා ගනිමින් කථනය මගින් සිදු කරන සන්නිවේදනය හා හඬ පාදක කරගෙන සිදුවන සන්නිවේදන ස්වරූප හඳුන්වන නාමයන් පිළිවෙළින් ලියන්න.

iii. ඵලදායී ලේඛනයක ලක්ෂණ **තුනක්** කෙටියෙන් හඳුන්වන්න.

iv. සිනමාව හා රූපවාහිනී මාධ්‍යයේදී නිශ්චල ඡායාරූප භාවිතය බහුලව සිදුවේ. එසේ භාවිත වන අවස්ථා **හතරක්** ඇසුරෙන් විස්තර කරන්න. (ලකුණු 10)

## සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය
## පිළිතුරු පත්‍රය
## I පත්‍රය

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1. | 3 | 11. | 3 | 21. | 1 | 31. | 1 |
| 2. | 2 | 12. | 1 | 22. | 2 | 32. | 3 |
| 3. | 4 | 13. | 2 | 23. | 2 | 33. | 2 |
| 4. | 2 | 14. | 1 | 24. | 1 | 34. | 4 |
| 5. | 1 | 15. | 3 | 25. | 3 | 35. | 3 |
| 6. | 3 | 16. | 2 | 26. | 2 | 36. | 2 |
| 7. | 1 | 17. | 4 | 27. | 3 | 37. | 4 |
| 8. | 4 | 18. | 4 | 28. | 4 | 38. | 3 |
| 9. | 2 | 19. | 3 | 29. | 3 | 39. | 2 |
| 10. | 3 | 20. | 4 | 30. | 3 | 40. | 2 |

(මුළු ලකුණු 01 X40 = 40)

## II පත්‍රය

(01) i. තොරතුරක් යනු සකස් කරන ලද දත්ත සමූහයකි.
තොරතුරක් යනු යම් සිදුවීමක්, අවස්ථාවක් කිසියම් කෙනෙකු නිරීක්ෂණය කර එම තොරතුර අන් අයට සන්නිවේදනය කිරීමයි.

ii. අති විශාල ජනස්කන්ධයට තොරතුරු බෙදා හරින විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍යයන් ජනමාධ්‍ය වේ.

iii. සුහුරු ජංගම දුරකථනය (Smart mobile phone)
SMS, සමාජ මාධ්‍ය, (Face book, What's App, Messanger, Viber, Imo....)

iv. අන්තර් ජාලයේ පලකරන විද්‍යුත් පුවත්පත

v. පුද්ගල මූලාශ්‍ර, ආයතනික මූලාශ්‍ර, ලිඛිත මූලාශ්‍ර, මාධ්‍ය මූලාශ්‍ර

vi. පුවත් ඉව, මූලාශ්‍රය පිළිබඳ දැනුම, ඉවසීම, සුහද බව, පුවත් තෝරා ගැනීම, උපායශීලී බව, අපක්ෂපාතී බව.

vii. නැවුම් බව, ප්‍රයෝජනවත් බව, සුවිශේෂී බව, සංවේදී බව, පරිකල්පන ශක්තිය, ඉහළ රුචිකත්වය

viii. තනි දාමය, ඕපාදූප දාමය, පර්ෂද දාමය, සම්භාවිතා දාමය

ix. චක්‍රලේඛ, නිල නිවේදන, ප්‍රවෘත්ති සාකච්ඡා

x.
- මාධ්‍ය මගින් ඉදිරිපත් කරන දෑ මෙන්ම සඟවන දෑ නිසි ලෙස අවබෝධ කර ගැනීමේ හැකියාව.
- තමන්ට අවශ්‍ය දෑ තෝරා බේරා ගැනීමේ හැකියාව

(02) i. අභිසාරිතාව, අභිසාරි මාධ්‍ය (Convergency)

ii.
- අදහස් ප්‍රබලව ඉදිරිපත් කිරීමට
- විශ්වසනීයත්වයට
- ආකර්ෂණයට
- මතක සටහනක් ලෙස තබා ගැනීමට
- සාක්ෂරතාව නොමැති වුවද අවබෝධ කර ගැනීමට
- පහසුවෙන් මුද්‍රණ තාක්ෂණය හා අනුගත වීම.

iii. ඉහළ සිට පහළට, පහළ සිට ඉහළට හරස් සන්නිවේදනය ඇතුළත් 10 ශ්‍රේණිය 56 පිටුව රූපය(එය මාධ්‍ය අධ්‍යයනයට අදාළව පැහැදිලි කිරීමට ද හැකිවේ.)

iv. ප්‍රවෘත්ති, සංගීතමය, වාර්තා, දේශනමය, සඟරාමය, ප්‍රශ්න විචාරාත්මක, සජීවී...... ආදී වැඩසටහන්, ගුවන් විදුලි නාට්‍ය, නිවේදන

(03) i. දොන් මර්තේලිස් කොළඹගේ (ඩී.එම්.කොළඹගේ)

ii.
- පරිකල්පනීය මාධ්‍යයක් වීම.
- වෙනත් වැඩක යෙදීමෙන් වුවද ශ්‍රවණය කළ හැකි වීම.
- එසැනින් තොරතුරු ලබා දීම.
- වැඩි පිරිසකට ක්ෂණිකව තොරතුරු ලබා දීමේ හැකියාව
- භූගෝලීය බාධා විරල වීම.
- ශ්‍රාවකයාට පහසුවෙන් සම්බන්ධ විය හැකි වීම.

iii. මුදල් ලබාදීම, විවිධ ත්‍යාග ලබා දීම, විවිධ වැඩසටහන් ආකෘති හඳුන්වා දීම, ශ්‍රාවකයා සජීවීව සම්බන්ධ කර ගැනීම, ආකර්ශනීය කථන විලාසය, සමාජ සත්කාරක වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

iv.
- වෘත්තිය මට්ටමේ මාධ්‍යවේදීන් සිටීම.
- දොරටුපාලන සංකල්පය ක්‍රියාත්මක වීම.
- ක්ෂණික හා අඛණ්ඩ බව
- ප්‍රතිපෝෂණ ප්‍රමාද වීම
- අසීමිත විෂමජාති ග්‍රාහකයන් සිටීම.

(04) i.
- ඇඩොබි පේජ්මේකර්
- ඇඩොබි ඉන්ඩිසයින්
- මයික්‍රොසොෆ්ට් පබ්ලිෂර්
- කොරල් ඩ්‍රෝ

ii.
- ඩොට් මුද්‍රණ යන්ත්‍ර
- ඉන්ක්ජෙට් මුද්‍රණ යන්ත්‍ර
- ලේසර් මුද්‍රණ යන්ත්‍ර
- ඡායා පිටපත් යන්ත්‍ර

iii.
- ලැමිනේටින් යන්ත්‍ර
- බැඳුම් උපකරණ හා ද්‍රව්‍ය
- කැපුම් යන්ත්‍රය

iv.
- මුඛ ආවරණ පැළඳිය යුතුය.
- දෑත් එකට එකතු කර ආචාර කිරීම.
- දෑත් සබන් ගා සේදිය යුතුය.
- මීටරයක පරතරය තිබිය යුතුය
- අත් ආවරණ පැළඳිය යුතුය.

(05) i. ඍජු වාර්තාකරණය

ii. කාලීන බව, සමීප බව, අදාළ බව, කැපී පෙනීම, ගැටුම, මානව ළැදියාව, බලපෑම හා වැදගත්කම, අසාමාන්‍ය බව

iii. නිවැරදි බව, සමතුලිත බව, පැහැදිලි බව, විශ්වසනීයත්වය (11 ශ්‍රේණිය - 16 පිටුව)



බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සංවර්ධන අංශය

iv. ජන සන්නිවේදනය
    1. දෛනික ජීවිතය වෙනස් කිරීම.
    2. පාරිභෝජන රටාව වෙනස් කිරීම.
    3. රසවින්දනය වෙනස් කිරීම.
    4. විවිධ චින්තවේග වැඩි දියුණු කිරීම.
    5. විවිධ අපචාරී චර්යා කරා යොමු කිරීම.
    6. විවිධ අයෝග්‍ය පුරුදු ඇති කිරීම............ ආදි යහපත් හා අයහපත් බලපෑම විස්තර කර ලිවිය හැක. (10 ශ්‍රේණිය - 35 පිටුව)

(06) i. නිශ්ක්‍රීය ග්‍රාහකයා
සක්‍රීය ග්‍රාහකයා

ii.
- තැපැල් පත්
- දුරකථන ඇමතුම්
- විද්‍යුත් පණිවිඩ
- කෙටි පණිවිඩ
- සමාජ ජාල වෙබ් අඩවි
- පුවත්පත් වලට ලිපි සම්පාදනය
- ලිපියක් ලෙස සකසා ප්‍රතිචාර දක්වා යැවීම.
- මාධ්‍ය පා ගමනක් හෝ උද්ඝෝෂණයක් සංවිධානයක් කිරීම.

iii. අයහපත් බලපෑම්
- සාම්ප්‍රදායික භාෂාව වෙනස් කිරීම.
- අවර ගණයේ රසවින්දනයට හුරු වීම.
- මාධ්‍ය වැඩසටහන් වලින් නිරූපණය කරන චරිත ළමුන්ගේ වීරයන් බවට පත් වීම.
- අපගේ සමාජ සංස්කෘතියට නොගැළපෙන විලාසිතාවලට යොමු වීම.

(10 ශ්‍රේණිය 118, 119 පිටු)

iv. ප්‍රක්ෂේපණය කළ හැකි මාධ්‍ය උපකරණ
- ප්‍රතිශීර්ෂ ප්‍රක්ෂේපණ යන්ත්‍රය
- කඳා ප්‍රක්ෂේපණ යන්ත්‍රය
- ක්ෂණික ප්‍රක්ෂේපණ යන්ත්‍රය
- බහු මාධ්‍ය ප්‍රක්ෂේපණ යන්ත්‍රය
- අන්තර් ක්‍රියාකාරී පුවරුව යන උපකරණවල ප්‍රබලතාවය ඉස්මතුවන අයුරින් කරුණුවලට ලකුණු දෙන්න.

(07) i. භාෂා ද්විරූපතාව

ii. වාචික සන්නිවේදනය
ශ්‍රව්‍ය සන්නිවේදනය

iii.
- නිරවුල් බව හා පැහැදිලි බව
- ලේඛනයට උචිත ආකෘතිය හා නිර්මාණශීලී බව
- සම්මත ව්‍යාකරණ විධි භාවිතය

(කරුණු වලට අනුව පැහැදිලි කර ඇත්නම් ලකුණු දෙන්න.) (10 - ශ්‍රේණිය පිටු 53)

iv. 10 ශ්‍රේණිය - පිටුව 143

# සිංහල සාහිත්‍ය රසාස්වාදය
## පිළිතුරු පත්‍රය
## I කොටස

(01) i. (අ) කුස රජතුමාගේ, බෝධි සත්ත්වයන්ගේ
(ආ) පබාවතී දේවිය

ii. (අ) නපුරු කලට - නරක කාලයට
මුකලිත - පරවීම
(ආ) කරන ලද පව්වලට විපාක ලබා දී මිස ඒ දුක් දුරු නොවේ.

iii. (අ) සුද්ධෝදන රජතුමා
(ආ) ධර්මසේන හිමියන්

iv. (අ) අශ්වයාට
(ආ) වැලපීම

v. (අ) සාගර පලන්සූරිය
(ආ) හිරු නැඟීම (ලකුණු 4 X 5 = 20)

(02) i. ගමේ එකට හැදුණු වැඩුණු මිතුරෙකු හොඳින් ඉගෙන නගරයට පැමිණ දිසාපති කෙනෙක් වූ පසු තම මිතුරා ඔහු බැලීමට ආ අවස්ථාවේ ඔහුව නොදන්නා කෙනෙකු ලෙස සැලකීම.

ii. භාෂාව රසවත් වීම, සරල බස, ව්‍යංගාර්ථය, චිත්ත රූප මැවීම, කවිය තුළින් සමීප අත්දැකීමක් ප්‍රතිනිර්මාණය වීම, ආකෘතිය, සංවාද බස, උත්ප්‍රේක්ෂාලංකාරය, සංකේත යොදා ගැනීම උදාහරණ සහිතව දක්වා තිබීම.

iii. විදුලි පංකාවේ හඬ පමණක් ඇසීම .................
මේස මත තිබූ ගල ලෙස නිහඬව සිටින අයුරු...............
බිත්තියේ ඇති සේයා රූ එබී බැලීම...............

iv. තමන් සමඟ කුඩා කළ සිට ගෙවූ ජීවිතය සිතට දනෙන අයුරු සිදුවීම් සමඟ හා අද දකින වෙනස ඉදිරිපත් කිරීම උචිතය.
එක් යුගයක ජීවිතයේ....
එසඳ ඔබෙ මුව'ග නැගුණු......
බාලේ අපි ගම්දොර කෙළි......
නැතියෙන් ඔබෙ වත හසරැලි.....

v. ගමේ හැදී වැඩුණත් නගරයට පිවිසීමත් සමඟ සමාජ තත්ත්වයට අනුව ජීවත් වන විට ග්‍රාමීය පරිසරයේ සියලු බැඳීම් ඉවත් කිරීමට පුළුවන් බව.
වේගවත් ආර්ථික රටාවට අනුව මිනිස් සිතුම් පැතුම් ගිලිහී යාම.
ඉසුරු බර ජීවිතයකට අවතීර්ණ වන විට තම අතීතය හිතා මතා අමතක කර දැමීම. කොතම් උසස් අධ්‍යාපනයක් ලැබුවද සාරධර්ම පෝෂණය නොවන ක්‍රමයේ ඇති වරද සමාජ විෂමතාවය සේම අධ්‍යාපන විෂමතාවය (උදාහරණ සමඟ (ලකුණු 5 X 5 = 25)

## II කොටස

(03) i. නන්ද තෙරුන් ශාසනය කළකිරී සිවුර හැරීමට සූදානම් වූ අවස්ථාවේ අනෙක් භික්ෂූන් වහන්සේලා මේ බව බුදුරදුන්ට සැලකර සිටින අවස්ථාව (ලකුණු 5)

ii. නන්ද තෙරුන් රැගෙන දෙව් ලොවට යන අවස්ථාවේ නව දළි හේනක් මවා වැදිරි මැහැල්ලක් මැවීමෙන් පසු දෙවඟනක් හා ජනපද කල්‍යානි හා සංසන්දනයක යෙදීම. (ලකුණු 5)

iii. දිව්‍යාප්සරාවන් ලබා ගැනීමේ අරමුණින් බණ භාවනා කිරීම, අවසානයේ නන්ද හිමි රහත් භාවයට පත්වීම. (ලකුණු 5)

iv. නන්ද කුමරු පැවිදි වීමට වඩා ලෞකික ජීවිතයට රුචියක් දක්වීම. ජනපද කල්‍යානි හා විවාහ පත්ව නව මාලිගයේ සැප සම්පත් භුක්ති විඳිමින් රාජ සුව විඳීමයි. දිවුල් ලාටු මුසු වයිකි තරව වැළඳ ගන්නා සේ යන උපමාව යොදා ලියා තිබීම.
නන්ද කුමරු ජනපද කල්‍යාණිය කෙරේ දැඩිව බැඳී සිටියේ ය. ගියත් සුළු වහා එවයි කීය. මස්සිනේ ගියත් වහා එන්නැයි කීය. මේ ප්‍රකාශය නන්ද කුමරුගේ හදවතේ ගැඹුරුම තැනට වැදිණි. (ලකුණු 10)
(මුළු ලකුණු 25)

නැතහොත්

i. උදේ ඉඳන් වහින වැස්සෙන් විඳි ගැහැට හා ඉන් මිදී තම නිවහනට ගොස් නා පිරිසිදු වී උණු උණුවට තේ කෝප්පයක රස බලන්නේ කෙලෙසද යනුවෙනි. (ලකුණු 5)

ii. දිගටම වහින වැස්ස
පොද නොකැඩී වහින වැස්ස
ඇඟිලි කරු අතර මඩ ගොහොරු රැඳීම
තද සුළඟත් සමඟම වැස්ස
දවස මුළුල්ලේම වැස්ස පැවතීම වැනි අර්ථ ඉස්මතු කිරීම. (ලකුණු 5)

iii. පාර තොට, ගහ කොළ ද වසාගෙන .......
මඩ කඩිති හැම තැන ම මඩ පාට දිය රැඳුන......
අළුත් පස් දැමූ පාර දනිහ තෙක් මඩ එරෙන......
තද සුළං පැවතීම වැනි යෙදුම් යොදා ලියා තිබීම. (ලකුණු 5)

iv. වැස්සේ ස්වභාවයට අදාළ වචන යොදා තිබීම.
සරල, සුගම භාෂාවක් යෙදීම.
සංකල්ප රූප මැවෙන ආකාරයේ වචන යොදා තිබීම.
වහින වැහි, වහින වැහි නොපායන මුළු දවස වැනි වාක්‍ය නිතරම යෙදීම තුළින් කවියට ජීවයක් ලබාදීම. (ලකුණු 10)
(මුළු ලකුණු 25)

## III කොටස

4,5,6,7 ප්‍රශ්න සඳහා ලකුණු ක්‍රමය

| | |
|---|---|
| උදාහරණ 03 | - ලකුණු 03 |
| උදාහරණ පිළිතුර හා ගැළපීම | - ලකුණු 12 |
| | මුළු ලකුණු 15 X 2 |

- ★ ප්‍රශ්නය හැඳින්වීම.
- ★ උදාහරණ 1 හා එය පැහැදිලි කිරීම.
- ★ උදාහරණ 2 හා එය පිළිතුරට සම්බන්ධ කිරීම.
- ★ උදාහරණ 3 හා එය පිළිතුරට සම්බන්ධ කිරීම.
- ★ නිගමනය හා සමාලෝචනය

# PAST PAPERS WIKI

## ප්‍රශ්නපත්‍ර පොත්
## ගෙදරටම ගෙන්වා ගන්න
## ඔන්ලයින් ඕඩර් කරන්න

www.store.pastpapers.wiki

## වෙත යන්න

BUY NOW

Secure Payments By PayPal VISA DISCOVER
NO PAYPAL ACCOUNT NEEDED!

# ONLINE BOOK STORE

An evening of fun for young readers




LOL.lk
Learn Ordinary Level
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර
• Past Papers • Model Papers • Resource Books
for G.C.E O/L and A/L Exams
සමනල දැනුම
විභාග ඉලක්ක ජයගන්න
Knowledge Bank
Master Guide
WWW.LOL.LK
HOME
DELIVERY
CASH ON DELIVERY
Whatsapp contact
+94 71 777 4440
Website
www.lol.lk
Order via WhatsApp
071 777 4440